ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

## <u>e-OCI (විද්‍යුත් අනේවාසික ඉන්දිය පුරවැසි) කාඩ්පත</u>

ඉන්දියානු රජය OCI කාඩ්පත් හිමියන් සඳහා ජාත්‍යන්තර සංචරණය වඩා සරල කිරීමේ අරමුණින් OCI ලේඛනයේ ඩිජිටල් ආකෘතිය වන e-OCI (විද්‍යුත් අනේවාසික ඉන්දිය පුරවැසි) කාඩ්පත හඳුන්වා දී ඇත. මේ අනුව සංචාරකයන් තවදුරටත් සෑම විටම භෞතික OCI කාඩ්පත රැගෙන යාම අවශ්‍ය නොවේ. e-OCI කාඩ්පත ජංගම දුරකථනයකට බාගත (download) කර ආගමන පරීක්ෂා ස්ථානයක දී හෝ සහභාගීවන ගුවන්සේවාවන්ට එය විදේශ ගමන් බලපත්‍රය සමඟ පෙන්විය හැකිය. ඔබගේ දැනට පවතින OCI කාඩ්පත තවදුරටත් වලංගුව පවතිනු ඇත.

e-OCI කාඩ්පත බාගත කිරීමේ පියවර

i. ඔබ ලියාපදිංචි වී ඇති විද්‍යුත් ලිපිනය සහ මුරපදය භාවිතා කර OCI සේවා පෝටලයට (OCI Services Portal) සම්බන්ධ වන්න. ඔබ දැනට ලියාපදිංචි වී නොමැති නම්, ඔබ OCI අයදුම් කිරීමේදී ලබා දුන් විද්‍යුත් ලිපිනය භාවිතා කරමින් ලියාපදිංචි වීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කරන්න.
ii. ඔබගේ ඩැෂ් පුවරුව (dashboard) මත දිස්වන 'e-OCI' ටැබ් (dashboard) එක ක්ලික් කරන්න.
iii. ඔබගේ අයදුම්පත ආසන්නයේ ඇති 'Generate e-OCI Card' යන්න තෝරන්න.
iv. ඔබගේ e-OCI කාඩ්පත ඔබගේ ජංගම දුරකථනයේ සුරක්ෂිතව සේව් කරන්න.

මෙම මුලපිරීමේ අරමුණ වන්නේ e-OCI කාඩ්පත් හිමියන්ට සංචරය කරන අතරතුර තම ලේඛනවලට වඩා පහසු ප්‍රවේශයක් ලබා දීමයි.

ඔබ OCI කාඩ්පත් හිමියෙකු නම් අදම ඔබගේ e-OCI කාඩ්පත බාගත (download) කරගන්න. ඔබගේ පවුලේ අය සහ මිතුරන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන්න.

විමසීම් සහ වැඩිදුර විස්තර සඳහා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ කොන්සියුලර් අංශය සමඟ සම්බන්ධ වන්න - cons2.colombo@mea.gov.in

***

**කොළඹ**

***2026 ජූලි 04***